# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2345/60 – 2023 අගෝස්තු මස 17 වැනි බ්‍රහස්පතින්දා – 2023.08.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2023 අංක 155 දරන ආඥාව**

මගේ යොමු අංකය : 4-3/4/2020/LRB/195.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී යොමු අංකය :
WGSWD&EIP/ACQ/KB/50.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමීත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 අගෝස්තු මස 02 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී –** වේරැස්ගඟ සංවර්ධන ව්‍යාපෘතිය

2. **ඉඩමේ විස්තරය –** බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 535 සී, නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පැපිලියාන (බොරලැස්ගමුව නගර සභා සීමාව තුල) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක : CO/DSO/2021/04 හා 2022.11.19 වන දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබලි වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – වරිපනම් අංකය සොයාගත නොහැකි සුනේත්‍රාදේවි පාර – ප්‍රමාණය: හෙක්. 0.0080**

උතුරට: සුනේත්‍රාදේවි පාරේ වරිපනම් අංකය සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි ඉඩම, සුනේත්‍රාදේවි පාරේ වරිපනම් අංක 410 දරණ ඉඩම සහ කැබලි අක්ෂර B; නැගෙනහිරට: කැබලි අක්ෂර B සහ C; දකුණට: කැබලි අක්ෂර C සහ සුනේත්‍රාදේවි පාර; බටහිරට: සුනේත්‍රාදේවි පාර සහ සුනේත්‍රාදේවි පාරේ වරිපනම් අංකය සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි ඉඩම.

02. **කැබලි අක්ෂර 'B' – වරිපනම් අංකය 410 සුනේත්‍රාදේවි පාර – ප්‍රමාණය: හෙක්. 0.0205**

උතුරට: සුනේත්‍රාදේවි පාරේ වරිපනම් අංක 410 දරණ ඉඩම; නැගෙනහිරට: සුනේත්‍රාදේවි පාරේ වරිපනම් අංක 410 දරණ ඉඩම; දකුණට: සුනේත්‍රාදේවි පාරේ වරිපනම් අංක 410 දරණ ඉඩම, ඇළ සහ කැබලි අක්ෂර C; බටහිරට: කැබලි අක්ෂර C, A සහ සුනේත්‍රාදේවි පාරේ වරිපනම් අංකය සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි ඉඩම.

03. **කැබලි අක්ෂර 'D' – වරිපනම් අංකය 406C සුනේත්‍රාදේවි පාර – ප්‍රමාණය: හෙක්. 0.0078**

උතුරට: කැබලි අක්ෂර C; නැගෙනහිරට: කැබලි අක්ෂර C සහ සුනේත්‍රාදේවි පාරේ වරිපනම් අංක 406/C දරණ ඉඩම; දකුණට: සුනේත්‍රාදේවි පාරේ වරිපනම් අංක 406/C දරණ ඉඩම සහ සුනේත්‍රාදේවි පාර; බටහිරට: සුනේත්‍රාදේවි පාර සහ කැබලි අක්ෂර C.

EOG 08 - 0186

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

### 2023 අංක 156 දරන ආඥාව

මගේ යොමු අංකය : 4-3/5/2018/HA/56.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය : 2/7/3/30.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 අගෝස්තු මස 02 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී** – ප්‍රාදේශීය ලේකම්, බෙන්තොට

2. **ඉඩමේ විස්තරය** – දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක ඃ 12F වියන්දූව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මරුමුල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මූ. පි. අංක ගා 4588 හා 2020.12.31 දිනැති මූලික පිඹුරේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 01 – මොරකැටියවත්ත නොහොත් මිල්ලගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0253**

උතුරට: එච්. ටී. ඩී. එල්. කමලාංගනී විසින් හිමිකම් කියන මිල්ලගහවත්ත (හිපි 179935), පී. ඒ. එච්. එස්. කුමාර විසින් හිමිකම් කියන මිල්ලගහවත්ත, පඩිපෙළ සහ එම්. යූ. ඩී. කුලසේන විසින් හිමිකම් කියන මිල්ලගහවත්ත; නැගෙනහිරට: පී.ඒ.එච්.එස්.කුමාර විසින් හිමිකම් කියන මිල්ලගහවත්ත, පඩිපෙළ, එම්.යූ.ඩී.කුලසේන විසින් හිමිකම් කියන මිල්ලගහවත්ත සහ එම්.ඩී.රණසිංහ විසින් හිමිකම් කියන මිල්ලගහවත්ත (හිපි 179936); දකුණට: එම්.ඩී.රණසිංහ විසින් හිමිකම් කියන මිල්ලගහවත්ත (හිපි 179936), මාර්ගය සහ එච්. ටී. ඩී. එල්. කමලාංගනී විසින් හිමිකම් කියන මිල්ලගහවත්ත (හිපි 179936 සහ හිපි 179935); බටහිරට: මාර්ගය සහ එච්.ටී.ඩී.එල්.කමලාංගනී විසින් හිමිකම් කියන මිල්ලගහවත්ත (හිපි 179936 සහ හිපි 179935).

EOG 08 - 0187

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.